සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

32 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ ව්‍යාපාර අධ්‍යයනය I කාලය පැය දෙකයි

උපදෙස්

- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. යන්ත්‍රසූත්‍ර, සම්පත් සංකලන පිළිබඳ තීරණ, යන්ත්‍ර යොදා ගනු ලබන කාල පරාසය, හිරු එළිය යන සාධක පිළිවෙළින් අයත් වනුයේ,
1. ප්‍රාග්ධනය, ශ්‍රමය, කාලය, භූමිය
2. ප්‍රාග්ධනය, ශ්‍රමය, ප්‍රාග්ධනය, භූමිය
3. ප්‍රාග්ධනය,ව්‍යවසායකත්වය, කාලය, භූමිය
4. භූමිය, ප්‍රාග්ධනය, කාලය, භූමිය
5. ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, තොරතුරු, භූමිය (...........)

02. ව්‍යාපාර යෙදවුමක් ලෙස සැලකිය නොහැක්කේ,
1. කාලය 2. දැනුම 3. තොරතුරු 4. මෙහෙයුම් 5. ව්‍යවසායකත්වය (...........)

03. තම තීරණ වල සාර්ථක අසාර්ථක බව දැනගැනීමට ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවය වන්නේ
1. කළමනාකරුවන් 2. සේවකයින් 3. අයිතිකරුවන්
4. ණයහිමියන් 5. සැපයුම්කරුවන් (...........)

04. ව්‍යාපාරයකින් සමාජයට ඉටු විය යුතු සමාජ වගකීමක් නොවන්නේ,
1. රැකියා නියුක්තිය ට දායක වීම
2. අපද්‍රව්‍ය කළමනාකරණය
3. ප්‍රජා සත්කාර සේවා
4. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම
5. වෘත්තීමය ආරක්ෂාව (...........)

05. ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේදී සලකා බැලිය යුතු කරුණක් නොවන්නේ,
1. ප්‍රායෝගික බව පිළිබඳව 2. දේශපාලනය පිළිබඳව 3. සේවකයින් පිළිබඳව
4. තරගකරුවන් පිළිබඳව 5. සංවිධාන සංස්කෘතිය පිළිබඳව (...........)

06. රජයෙන් ව්‍යාපාර වලට ලැබෙන සහාය හා මග පෙන්වීම් වැදගත් වන ආකාර කිහිපයක් හා රජය ව්‍යාපාර වලට මැදිහත් වන ආකාර කිහිපයක් පහත දැක්වේ
A ව්‍යාපාර ලියාපදිංචියට යොමුවීම
B ප්‍රතිපත්ති සම්පාදනය
C කීර්තිනාමය වර්ධනය වීම
D නීති රීති පැනවීම
E තරගකරුවෙක් වීම
F රටේ සංවර්ධනයට දායක වීම
G රජයේ හා මහජනයාගේ පිළිගැනීම
ඉහත දැ අතුරෙන් රජයෙන් ව්‍යාපාර වලට ලැබෙන සහාය හා මගපෙන්වීම් වැදගත් වන ආකාර ඇතුලත් කාණ්ඩය කුමක්ද?
1. A,B,C,E 2. A, C, F, D 3. A, C, D, F 4. A, B, D, G 5. A, C, F,G (...........)

07. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන් කිහිපයක් සහ එම ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර කිහිපයක් පහත දැක්වේ.

A පූර්ව අපනයන පරීක්ෂාව
B උපකරණ ක්‍රමාංකනසේවා
C SLS සහතික ලාංඡන ක්‍රමය පවත්වාගෙන යාම.
D පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
E අපනයනය පිළිබඳ පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින්
F ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
G ආනයන පරීක්ෂාව

ඉහත දෑ අතුරෙන් ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර ඇතුලත් කාණ්ඩය කුමක්ද?

1. A,B,C,E 2. A, C, D, F 3. A, C, E, G 4. B, D, F, G 5. B, E, F,G (...........)

08. පහත ප්‍රකාශ අතුරින් එක් ප්‍රකාශයක් හැර අනෙකුත් ප්‍රකාශ සියල්ල හවුල් ව්‍යාපාර වලට අදාළ ලක්ෂණ වේ. අදාල නොවන ප්‍රකාශය තෝරන්න.

1. වගකීම අසීමිත වේ.
2. ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් නැත
3. නෛතික පුද්ගල බවක් ඇත
4. පදිංචිය අනිවාර්ය නොවේ.
5. අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය පවතී (...........)

09. පහත සඳහන් වන්නේ ව්‍යාපාර සංවිධාන කීපයක් හා ඒවාට අදාළ ගති ලක්ෂණ වේ.

| **ව්‍යාපාර සංවිධාන** | **ගතිලක්ෂණ** |
|---|---|
| 1. හවුල් ව්‍යාපාර | A. සාමාජික සංඛ්‍යාව අවම 10 |
| 2. සීමාසහිත පොදු සමාගම් | B. ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කරයි |
| 3. සීමාසහිත පුද්ගලික සමාගම | C. කොටස් වෙළඳපොළට සම්බන්ධ විය නොහැක |
| 4. රාජ්‍ය සංස්ථා | D. සාමාජික සංඛ්‍යාව උපරිම 20 |
| 5. සමුපකාර | E. විශේෂ පනත් මගින් ද ආරම්භ කරයි. |

1. 1-A , 2-B, 3-C, 4-D, 5-E
2. 1 -A, 2-C, 3-B, 4-D, 5-E
3. 1-D, 2-B, 3-C, 4-E, 5-A
4. 1-D, 2-C,3-B, 4-E, 5-A
5. 1-2, 2-E, 3-B, 4-C, 5-A (...........)

10. 1. විවිධ නාමයන්ගෙන් හඳුන්වයි.
2. 51% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජයේ ප්‍රාග්ධනය.
3. වගකීම සීමිත වේ.
4. මධ්‍යම රජයේ ව්‍යාපාර ගණයට අයත් වේ.

ඉහත ප්‍රකාශ වලින් කියවෙන්නේ,

1. රජයේ සමාගම් පිළිබඳ 2. රජයේ දෙපාර්තමේන්තු පිළිබඳ 3. සංස්ථාපිත සමාගම් පිළිබඳ
4. රාජ්‍ය සංස්ථා පිළිබඳ 5. හවුල් ව්‍යාපාර පිළිබඳ (...........)

11. නවෝත්පාදන සිදුවන ආකාරයක් නොවන්නේ,

1. පෙර නොතිබූ නව භාණ්ඩයක් බිහිකිරීම.
2. පවතින වෙළඳපොලට පවතින භාණ්ඩයක් ඉදිරිපත් කිරීම.
3. පවතින භාණ්ඩයක නව භාවිතයක් ඇති කිරීම.
4. පවතින සංකල්පයට සමාන ව නිපදවූ නව නිපැයුමක්
5. පවතින සංකල්ප හෝ සාධක වල නව සංයෝගයක් භාවිතා කර නිපදවීම . (...........)

12. x හා y තීරුවලින් දැක්වෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබා දීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයක් සහ මූල්‍ය අනුග්‍රහය සපයන ආයතන කිහිපයකි. එම තීරු දෙක ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | සුවන | A | ආසියානු සංවර්ධන බැංකුව |
| 2. | ලියඉසුර | B | ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු |
| 3. | සහන්යා | C | ප්‍රාදේශීය සංවර්ධන බැංකු |
| 4. | ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය | D | අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව |
| 5. | සණස ණය ව්‍යාපෘතිය | E | කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු |

1. 1-D, 2-C, 3-A, 4-E, 5-B 2. 1-D, 2-A, 3-C, 4-B, 5-E 3. 1-B, 2-C, 3-A, 4-B, 5-E
4. 1-E, 2-B, 3-C, 4-A,5-D 5. 1-D, 2-C, 3-C, 4-E, 5-B (...........)

13. පහත දැක්වෙන්නේ මුදලේ කාර්යයන් හා මුදලේ ගුණාංග කිහිපයකි.
A. බෙදන සුළු බව B. විනිමය මාධ්‍යයක් වීම
C. ආරක්ෂණ සංකේත D. සමජාතීය බව
E. වටිනාකමේ මිම්මක් වීම F. විලම්භීත ගෙවුම් මාධ්‍යයක් වීම
මින් මුදලේ ගුණාංග පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ ,
1. A, B හා F 2. A, C හා D 3. B, C හා D 4. B, E හා F 5. C, D හා E (...........)

14. පහත සඳහන් ආයතන අතුරින් ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතනයක් නොවන්නේ කුමක් ද?
1. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල. 2. සේවක අර්ථසාධක අරමුදල
3. විශේෂිත කල්බදු සමාගම් 4. රක්ෂණ සමාගම්
5. සේවක භාරකාර අරමුදල (...........)

15. ශ්‍රී ලංකාවේ චෙක්පත් නිශ්කාශනය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනය වන්නේ,
1. ශ්‍රී ලංකා මහ බැංකුව 2. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
3. මධ්‍යම තැන්පතු ක්‍රම පුද්ගලික සමාගම 4. ලංකා ක්ලියර් පුද්ගලික සමාගම
5. ඉහත කිසිදු ආයතනයක් නොවේ (...........)

16. රක්ෂණය කළ නොහැකි අවදානමක් වන්නේ,
1. ජීවිතය පිළිබඳ අවදානම
2. අනාගත වෙළෙඳපොළ තේරුම් ගැනීමට නොහැකි වීමෙන් ඇතිවන හානි
3. මාර්ගස්ථ භාණ්ඩ වලට වන හානි
4. ණයගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම
5. වාහන අනතුරුවලින් සිදුවන හානි (...........)

17. රක්ෂණ මූලධර්මයක් නොවන්නේ,
1. ප්‍රතිපූර්ණය 2. උපරිම විශ්වාසය 3. ආදේශනය 4. දායකත්වය 5. ආසන්නම හේතුව (...........)

18. ආර්ථික හා සමාජ සංවර්ධනයේ සහ ගෝලීයකරණයේ ප්‍රධානම උපාංගය ප්‍රවාහනයයි. ප්‍රවාහනය විවිධ පාර්ශව වලට වැදගත් වන ආකාර කීපයක් පහත දැක්වේ.
A වෙළඳපොළ ව්‍යාප්තියට B සමාජ සබඳතා ඇතිකර ගැනීමට
C සේවා නියුක්තිය වර්ධනය වීම D ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට
E අමුද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීමට F විදේශ වෙළඳාම වර්ධනය වීමට
G සේවකයින් නියමිත වේලාවට ගෙන්වාගැනීමට
ඉහත දෑ අතුරින් ව්‍යාපාරිකයාට ප්‍රවාහනය වැදගත් වන ආකාරය දක්වන කාණ්ඩය කුමක්ද?
1. ABEF 2. ACDE 3. AEFG 4. ADEG 5. ADEG (...........)

19. සිල්ලර වෙළඳාමේ හා තොග වෙළඳාමේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A විවිධ වර්ගයේ භාණ්ඩ රැසක් අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම.

B පාරිභෝගිකයෙක් සමග සමීප සම්බන්ධතා පවත්වාගෙන යාම.

C වෙළඳ වට්ටම් ලබා දීම

D අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම

E බොහෝ විට ණය පදනම මත භාණ්ඩ අලෙවිය

F වෙළෙඳපොල පිළිබඳ පර්යේෂණ කිරීම

G භාණ්ඩ තොග ප්‍රවාහනය කර දීම.

ඉහත දෑ අතුරෙන් තොග වෙළඳාමේ ලක්ෂණ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

1. ABEF 2. BDEF 3. ADEF 4. CDEG 5. CDFG (...........)

20. නැව්ගතකරන භාණ්ඩ අපනයනය කරන රටේම නිපදවා ඇති බවට සහතික කරමින් පිළිගත් වෙළඳ මණ්ඩලයකින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි.

1. ආනයන සටහන්කරය 2. ණයවර ලිපිය 3. ප්‍රභවස්ථාන සහතිකය
4. අපනයන බලපත්‍රය 5. නෞභාරපත (...........)

21. ආනයනයක අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කිරීම හා ඒවා ඉටුකර ගැනීමට උපාය මාර්ග තීරණය කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,

1. දෙපාර්තමේන්තුකරනය 2. සංවිධානකරණය 3. කළමනාකරණය
4. සැලසුම්කරණය 5. මෙහෙයවීම ලෙසිනි (...........)

22. පහත A හා B තීරුවල ගැළපූ විට,

| | A | B |
|---|---|---|
| 1. | අරමුණු | අ. ප්‍රමිති ස්ථාපනය |
| 2. | පාලනය | ආ. අභිප්‍රේරණය |
| 3. | මෙහෙයවීම | ඉ. මධ්‍යගතකරණය |
| 4. | සැලසුම් කිරීම | ඊ මැනිය හැකි බව |
| 5. | අධිකාරිය | උ නම්‍යශීලී බව |

1. 1-අ, 2-ආ, 3-ඉ, 4-ඊ, 5-උ 2. 1-අ, 2-ඉ, 3-ඉ, 4-උ, 5-ආ 3. 1-ආ, 2-ඊ, 3-ඉ, 4-ආ, 5-උ
4. 1-ඊ, 2-අ, 3-ආ, 4-උ, 5-ඉ 5. 1-ඊ, 2-අ, 3-උ, 4-ඉ, 5-ආ (...........)

23. නිෂ්පාදන ඉංජිනේරු කරණයට අයත් නොවන ප්‍රකාශය තෝරන්න.

1. නිෂ්පාදන ක්‍රියාවලිය තීරණය කිරීම 2. අවශ්‍ය යන්ත්‍රාගාර හා උපකරණ තීරණය
3. යාන්ත්‍රික පාලනය 4. නිෂ්පාදන කාලසටහන් තීරණය
5. අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය තීරණය කිරීම (...........)

24. ''කිසියම් කාර්යයක නියැළී සේවකයන් කුඩා කණ්ඩායම් වශයෙන් එක් වී සාකච්ඡා මගින් ඔවුන් මුහුණපාන ගැටලු හඳුනාගෙන විසඳුම් ඉදිරිපත් කරයි.'' ඉහත ලක්ෂණ ඇතුලත්වන ගුණත්ව පරීක්ෂා කිරීමේ ක්‍රමය තෝරන්න.

1. ගුණත්ව ප්‍රමිති 2. තත්ව කව 3. ශුන්‍ය දෝෂ
4. තත්ව ආරක්ෂණය 5. තත්ව පාලනය (...........)

25. පාරිභෝගික වෙළෙඳපොළ ඛණ්ඩනය සඳහා අලෙවි කරුවන් යොදා ගන්නා පාරිභෝගික ගති ලක්ෂණ පහත දැක්වේ.

A ස්ත්‍රී පුරුෂ බව B ආදායම C පවුලක ප්‍රමාණය

D ජීවන රටාව E පෞරුෂත්වය F වෘත්තීය

මෙයින් ප්‍රජා විද්‍යාත්මක සාධක පමණක් නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

1. A,B,C,D 2. A,B,C,E 3. A, B, E, F 4. B, C, D, E 5. A,D,E,F (...........)

26. X තීරුව මගින් අලෙවිකරුගේ දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය හා Y තීරුව මගින් පාරිභෝගික දෘෂ්ටියෙන් අලෙවිකරණ මිශ්‍රය දැක්වේ

| | X | Y |
|---|---|---|
| A | නිෂ්පාදිතය | 1. පහසුව |
| B | මිල | 2. සන්නිවේදනය |
| C | ප්‍රවර්ධනය | 3. පාරිභෝගික විසඳුම (අවශ්‍යතා හා උවමනා) |
| D | ස්ථානය | 4. පිරිවැය |

අලෙවිකරුගේ දෘෂ්ටියෙන් හා පාරිභෝගික දෘෂ්ටියෙන් අලෙවිකරණ මිශ්‍රය නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

1. A-2, B-3, C-4, D-1 2. A-3, B-4, C-2, D-1 3. A-1, B-2, C-3, D-4
4. A-2, B-1, C-3,D-4 5. A-3, B-4, C-1, D-2 (...........)

27. ව්‍යාපාර ආයතනයක ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය රඳවා ගැනීමට අදාල කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A පිරිවැය පාලනය B මිල කිරීම.
C අරමුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම D ඉපයුම් අනුපාත ගණනය කිරීම
E අරමුදල් ලබා ගැනීම

ඉහත කාර්යයන් අතරින් ලාභදායකත්වය කෙරෙහි ඍජුව බලපාන කාර්යයන් දැක්වෙන පිළිතුර කාණ්ඩය වන්නේ,

1. E,A 2. B.D 3. E,D 4. A,E 5. C,D (...........)

28. මූල්‍ය කලමනාකරණයේ අරමුණු ඉටුකරගැනීමට ගනු ලබන මූල්‍ය තීරණ, ආයෝජන තීරණ හා මූල්‍යනතීරණ ලෙස කොටස් දෙකකි. පහත සඳහන් කාණ්ඩ අතරින් මුල්‍යන තීරණ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. කොටස් ප්‍රාග්ධනය, ණය ප්‍රාග්ධනය, ලාභාංශ, ව්‍යාපාරය පුළුල් කිරීමේ තීරණ
2. ණයගැතියන්, බඩුතොග, මුදල් සහ ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ
3' ණය හිමියන්, ලාභාංශ, කොටස් ප්‍රාග්ධනය, සහ ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ
4. ස්ථාවර වත්කම්, මුදල්, වෙළඳ බඩු තොග හා ණය ගැතියන් පිළිබඳ තීරණ
5. ණයහිමියෝ, කොටස් ප්‍රාග්ධනය, මුදල් , ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ (...........)

29. ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග අභ්‍යන්තර හා බාහිර ලෙසත් ඍජු හා වක්‍ර ලෙසත් වර්ගීකරණය කළ හැක. පහත සඳහන් ඒවා අතරෙන් ඍජු හා අභ්‍යන්තර අරමුදල් සම්පාදන මාර්ගයක් වන්නේ,

1. ණයකර නිකුතුව 2. බැංකු ණය 3. කල්බදුය 4. රඳවාගත් ලාභය 5. කොටස් නිකුතුව (...........)

30. බොහෝ විට දිවා ආහාර විවේකය වැනි අවස්ථාවකදී සේවකයන් ව්‍යාපාරය ඉදිරිපිට පෝස්ටර්, දැන්වීම්, බැනර් වැනි විරුද්ධත්වය ප්‍රකාශ කරන පුවරු ප්‍රදර්ශනය කරමින් කරනු ලබන සාමකාමී උද්ඝෝෂණයකි. ඉහත උපුටනයෙන් දැක්වෙන්නේ කුමන වෘත්තිය ක්‍රියා මාර්ගයක් ද ?

1. අකුරට වැඩ කිරීමයි 2. පිකටිං හෙවත් ප්‍රතිභාහනයයි 3. වැඩ මගහැරීමයි
4. සංකේත වැඩ වර්ජනයයි 5. වැඩ වැරීම හෙවත් වැඩ වර්ජනයි (...........)

- **31 සිට 40 දක්වා වූ ප්‍රශ්න වලට අදාල හිස්තැන් පුරවන්න**

31. (අ) සංවිධානයක් සතු මූල්‍ය සම්පත් එහි ...................................... පරිසර සාධකයක් වන අතර සමාජ හා සංස්කෘතික පරිසරය ..............................පරිසරයේ කොටසක් වේ.

(ආ) පරිමාව අනුව ව්‍යාපාර ................................................ ව්‍යාපාර හා ............................................................ ව්‍යාපාර ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක.

32. (අ) සේවකයින්ට සමාන ලෙස සැලකීම ........................................................ අයත් ආචාර ධර්මයක් වන අතර පරිසර දූෂණය අවම කිරීම ........................................................ අදාල ආචාර ධර්මයකි.

(ආ) නැවත නැවත භාවිතයට ගැනීම R ........................................................ ලෙසත් පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම R........................................................ ලෙසත් හඳුන්වයි.

33. (අ) සාර්ව ආර්ථික ස්ථායිතාවයේදී උද්ධමනය පාලනය ........................................................ තුළින් සිදු කරන අතර විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම ........................................................ තුළින් සිදු කෙරේ.

(ආ) රජයක් විසින් දරනු ලබන වැටුප් හා වේතන වියදම ........................................................අයත් වන අතර මහා මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා දරන වියදම් ........................................................ ලෙස හැඳින්වේ

34. (අ) සෑම හවුල්කරුවකුම සෙසු හවුල්කරුවන්ගේ ........................................................ හා ........................................................ වශයෙන් සැලකීම අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය ලෙස හැඳින්වේ.

(ආ) වරලත් හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ ඔහුගෙන් මිලට ගෙන නැවත විකිණීමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර ........................................................ වරලත් ව්‍යාපාර වන අතර වරලත් හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදාහැරීමට වරලත්ලාභියා ට පැවරෙන අයිතිය ........................................................ වරලත් ව්‍යාපාර වේ.

35. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගැනීම සඳහා සේවක සංඛ්‍යාව 25 ට අඩු වීම නිර්ණායකයක් ලෙස ........................................................ ඉදිරිපත් කර ඇති අතර

(ආ) සේවක සංඛ්‍යාව 50 ට අඩු වීම නිර්ණායකයක් ලෙස ........................................................ ඉදිරිපත් කර ඇත.

36. (අ) පණිවිඩයක තිබිය යුතු මූලික ගුණාංග ඇතුළත් ග්‍රාහකයාගෙන් ක්ෂණිකව ප්‍රතිචාරයක් ලබා ගත හැකි බාධාවලින් තොර සන්නිවේදනය ........................................................ ලෙස හැඳින්වේ.

(ආ) ආයතනයක් තුළ විහිදී ඇති අභ්‍යන්තර දුරකථන පද්ධතිය ........................................................ ලෙස හැඳින්වේ.

37. (අ) ආයතනයක අරමුණු අපේක්ෂිත ආකාරයෙන් ළඟාකර ගැනීමට නිවැරදි දෙය කිරීම ........................................................ ලෙස හැඳින්වෙන අතර,

(ආ) අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීමේදී කළ යුතු කාර්යය නිවැරදිව කිරීම ........................................................ ලෙස හැඳින්වේ.

38. නිෂ්පාදන ක්‍රියාවලිය යෙදවුම්, පරිවර්තන හා නිමවුම් යන කාර්යයන් ගෙන් සමන්විත වන අතර පරිවර්තන ක්‍රියාවලිය 1. එකලස් කිරීම 2. ........................................................ , 3. ........................................................ 4. දැනුම යන දෑ අයත් වේ.

39. (අ) වෙළඳපොලට ඉදිරිපත් කරන ගුණාත්මක භාණ්ඩයක හෝ සේවාවක........................................................ , ........................................................ හා ........................................................ යන අංග අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතුය.

(ආ) ආයතනයේ හෝ නිෂ්පාදිත භාණ්ඩයේ ප්‍රතිරූපය ආරක්ෂා කරගැනීමට හා පවත්වා ගැනීමට වර්ධනය කිරීමට ආයතනය හා සම්බන්ධ විවිධ පාර්ශව සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීම ........................................................ලෙස හඳුන්වයි.

40. (අ) කොටස් වෙළඳපොළට ඇතුළත් වීම ........................................................ මගින් හෝ ........................................................මගින් සිදු කළ හැක.

(ආ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වන සමාගම් ........................................................ හෝ ........................................................ ලේඛන ගත කෙරේ.

- **අංක 41 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

41. සෘජු සේවා හතරක් සඳහන් කරන්න.

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................

42. ව්‍යාපාර සමාජ වගකීම් ඉටු විය යුතු ප්‍රධාන පාර්ශව හතරක් සඳහන් කරන්න.

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................

43. ණයපතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව කවරේද?

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................

44. වගකීම් රක්ෂණ ප්‍රභේද හතරක් සඳහන් කරන්න.

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................

45. උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු හතරක් නම් කරන්න.

1. ........................................................
2. ........................................................
3. ........................................................
4. ........................................................

46. තොග වෙළෙන්දාගෙන් සිල්ලර වෙළෙන්දාට ඉටු වන සේවා හතරක් දක්වන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

47. සංවිධාන ව්‍යුහයක දැක්වෙන මූලිකාංග හතරක් දක්වන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

48. ප්‍රචාරණය ප්‍රධාන වශයෙන් බෙදා දක්වන කොටස් වර්ග මොනවාද?

1. ..........
2. ..........
3. ..........
4. ..........

49. මුදල් වෙළඳ පොළේ උප වෙළෙඳපොළ 4 ක් නම් කරන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

50. මානව සම්පත් කලමනාකරනයේ සුවිශේෂී අරමුණු හතරක් සඳහන් කරන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32 | S | II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ **ව්‍යාපාර අධ්‍යයනය II** කාලය පැය තුනයි

- **උපදෙස් :- ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. (i) (අ) ව්‍යාපාරයක ගති ලක්ෂණයක් ලෙස ''ලාභයෙන් අභිප්‍රේරණය වීම'' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) වර්ථමානය තුළ ව්‍යාපාරයක් නම්‍යශීලී ගතික ස්වභාවයක් ගැනීමේ ඇති වැදගත්කම දැක්වෙන කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (අ) ''ව්‍යාපාර'' හා ''වාණිජ්‍ය'' යන වචන එක සමාන අර්ථයක් ගෙන නොදෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) 2017 වසරේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව කෘෂිකාර්මික කාර්මික හා සේවා යන අංශවල දළ දේශීය නිෂ්පාදිතයට දැක්වූ ආංශික දායකත්වය ප්‍රතිශත වශයෙන් දක්වා ශ්‍රී ලංකාවේ 2017 වසරේ ආර්ථික වර්ධන වේගය (අනුපාතය) සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) වර්තමාන ලෝක වෙළෙඳපොළ තුළ අඩු පිරිවැය ශ්‍රමයට ලැබෙන වැදගත්කම පැහැදිලි කරන්න(ලකුණු 4)

(iv) (අ) ව්‍යාපාර ආයතනයක පර්යේෂණ හා සංවර්ධන කටයුතු දෙකක් හා තොරතුරු කළමනාකරණ කටයුතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයක හිමිකරුවන් ව්‍යාපාරය කෙරෙහි උනන්දු වීමට හේතු හතරක් සඳහන් කරන්න.(ලකුණු 2)

(v) (අ) සංවිධානමය සංස්කෘතිය ව්‍යාපාරයකට දුර්වලතාවයක් නිර්මාණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ශ.දු.අ.ත විශ්ලේෂණය පසු හඳුනාගත් සාධක සම්බන්ධයෙන් ව්‍යාපාරික ප්‍රතිචාරය කෙසේ විය යුතු දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

02. (i) ව්‍යාපාරයක් විසින් ව්‍යාපාර ආරම්භ ආචාර ධර්මවලට පටහැනිව කටයුතු කරනු ලබන අවස්ථා අටක් සඳහන් කරන්න. (ලකුණු 4)

(ii) (අ) බද්දක් යනු කුමක්ද? සෘජු බදු වර්ග දෙකක් නම් කරන්න . (ලකුණු 2)

(ආ) ''වාණිජ බැංකු පොලී අනුපාතය පහලට'' මෙම තත්ත්වය ව්‍යාපාර වලට බලපෑම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) පාරිභෝගික අයිතිවාසිකම් මෙන්ම පාරිභෝගික වගකීම්ද පාරිභෝගිකයා සතු වූවකි. පාරිභෝගික වගකීම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(iv) ජානක හා සේනක කුඩා කල සිට මිතුරන් ලෙස සහයෝගයෙන් කටයුතු කළ දෙදෙනෙකි. රජයේ රැකියාවන්හි නිරත වන මේ දෙදෙනා අතිරේක ආදායමක් ඉපයීමේ පරමාර්ථයෙන් හවුල් ව්‍යාපාරයක් ඇරඹීමට සිතයි. මේ පිළිබඳ අදහස් දැක්වූ ඔවුනගේ මිතුරෙකු වූ මාලක එම ව්‍යාපාරයේ වගකීම අසීමිත බවත් වගකීම සීමිත වූ ව්‍යාපාරයක් ආරම්භ කරන ලෙසත් උපදෙස් දෙන ලදි.

(අ) (i) එම උපදෙස් වලට අනුව මොවුන්ට ඇරඹිය හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? (ල.1)

(i) ඔබ දැක්වූ එම සංවිධාන වර්ගයේ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 1)

(ආ) ඉහත ප්‍රකාශයේ මිතුරන් ඇරඹීමට සිතූ හවුල් ව්‍යාපාරයේ හා මිතුරා ගේ උපදෙස් වලට අනුව ඇරඹූ ව්‍යාපාර සංවිධානය අතර වෙනස්කම් හතරක් ලියන්න. (ලකුණු 2)

(v) (අ) 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන්නාවූ සමාගමේ ලාභ බෙදා හැරීමක් සිදු නො වන්නා වූ සීමිත සමාගම් වර්ගය නම් කරන්න. (ලකුණු 2)
(ආ) ඔබ නම් කළ සමාගම් වර්ගයේ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 2)

03. (i) (අ) පහත ආයතන හිමිකාරිත්වය අනුව කුමන සංවිධාන වර්ගයට අයත් වන්නේ දැයි ලියන්න.
මහජන බැංකුව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, සීමාසහිත විදුලිබල (පුද්ගලික) සමාගම, මහවැලි අධිකාරිය, සීමාසහිත ලංකා හොස්පිට්ල්ස්.
(ආ) (i) පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පවත්වාගෙන යන්නා වූ ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න. (ලකුණු 1)
(ii) ඔබ දැක් වූ ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ දෙකක් හා එම ව්‍යාපාරයේ අකාර්යක්ෂමතාවයට හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 1)
(ii) (අ) ව්‍යවසායකත්වයේ ප්‍රවණතා නම් කර එයින් දෙකක් විස්තර කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර රූප සටහනකින් ඉදිරිපත් කරන්න. (ලකුණු 2)
(iii) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් පැහැදිළි කරන්න. (ලකුණු 4)
(iv) (අ) තත්කාලීන දළ පියවීම් පද්ධතිය (Real time gross settlement system) යන්න හඳුන්වා එහි සහභාගිකරුවන් නම්කරන්න. (ලකුණු 2)
(ආ) අගරු වූ චෙක්පතක් සම්බන්ධයෙන් ධාරකයෙකු ට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග කවරේද? (ල. 2)
(v) (අ) ලංකාවේ රුපියල අවප්‍රමානය කිරීමෙන් පාරිභෝගිකයට ඇතිවිය හැකි බලපෑම් කවරේද? (ල. 2)
(ආ) '' ලයනල් තම මෝටර් රථය රුපියල් මිලියන 10කට නාරායනට අලෙවි කළේය. නාරායන එවෙලේම රුපියල් මිලියන තුනක් ලයනල්ට ගෙවූ අතර ඔහු එම මුදල එදිනම තැන්පත් කළේය. ඉතිරි මුදල මාස දෙකක් තුළ ගෙවීමට නාරායන එකඟවිය.''
ඉහත සිද්ධිය තුල මුදලින් සිදුකර ඇති කාර්යයන් නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 2)

04. (i) (අ) අවදානමක් රක්ෂණය කළ හැකි අවදානමක් වීමට නම් එහි තිබිය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) ''රක්ෂණයෙන් අවදානම් වැළැක්විය නොහැකිය'' පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ii) (අ) රසික තම මෝටර් රථය පූර්ණ රක්ෂණ අවධාරණයක් ලබාගෙන තිබූ නමුත් ඔහුගේ මෝටර් රථයට ගංවතුර තත්වයක් නිසා ඇති වූ අලාභයට වන්දි ගෙවීම අදාළ රක්ෂණ සමාගම ප්‍රතික්ෂේපකරන ලදි. රක්ෂණ සමාගමට එසේ කළ හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) සඵලදායි සන්නිවේදනය ව්‍යාපාර වල පැවැත්ම හා වර්ධනයට ඉවහල් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)
(iii) (අ) ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ විද්‍යුත් හා අංකිත තාක්ෂණය යටතේ බහුලව යොදාගන්නා සන්නිවේදන ක්‍රම හතරක් සඳහන් කර, ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 2)
(ආ) පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග දක්වන රූප සටහනක් අඳින්න. (ලකුණු 2)
(iv) (අ) විදේශ වෙළඳාම සඳහා පදනම් වී ඇති සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) විද්‍යුත් වෙළඳාමේ ක්‍රියා පටිපාටිය සඳහන් කරන්න. (ලකුණු 2)
(v) විදේශ වෙළඳාමේ දී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රම හතරක් නම් කර පැහැදිලි කරන්න. (ල. 4)

## II - කොටස

05. (i) (අ) ආයතනයකට, සංවිධානයකට පමණක් නොව පුද්ගල අරමුණු පරමාර්ථ ඉටුකර ගැනීමට ද කළමනාකරණය වැදගත් වේ. පුද්ගලයින්ට කළමනාකරණය වැදගත් වීමට හේතු දක්වන්න. (ල.2)

(ආ) කළමනාකරණයේදී ගතික ව්‍යාපාර පරිසරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. 'ගතික ව්‍යාපාර පරිසරය' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

(ii) (අ) කළමණාකරණය මගින් ව්‍යාපාරයක් තම අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට වෙහෙසක් දරයි. අරමුණු යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කර එහි තිබිය යුතු ගුණාංග නම්කරන්න. (ලකුණු 2)

(ආ) පහත දැක්වෙන සංවිධාන සටහන කුමන ආකාරයේ සංවිධාන සටහනක් ද යන්න දක්වා, ඔබට එය ඉදිරිපත් කළ හැකි තවත් ආකාරයක් දක්වන්න. (ලකුණු 2)




(iii) ගයාන් තමාගේම ලීබඩු ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. ඔහුගේ විශේෂත්වය නම් කැපවීම හා බුද්ධිමත්ව තම කටයුතු පවත්වාගෙන යාමත්, ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානයෙන් යුතුව තම ව්‍යාපාරයේ කටයුතු කරගෙන යාමත්ය. තම කටයුතු සඳහා එහි සේවයේ නියුතු සියලු දෙනා හිතෛෂීව අතහිත දෙන අතර යම් යම් තීරණ ගැනීම්වලදී සේවක අදහස් පිළිබඳව ද සැලකිලිමත් වීම හේතුකොටගෙන ආයතනය තුළ අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය වී ඇත.

(අ) මෙහි නායකයා කටයුතු කරන ආකාරය අනුව කුමන නායකත්ව ශෛලියක් පෙන්නුම් කරයි ද? (ලකුණු 2)

(ආ) මෙම සිද්ධි අධ්‍යයනයකර මෙහි සඳහන් නායකයෙකු සතු ගුණාංග ලයිස්තුගත කරන්න. (ලකුණු 2)

(iv) අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයකු විසින් තම යහළුවකු හට පාසල පිළිබඳ පහත තොරතුරු ඉදිරිපත් කරන ලදී.

''අප පාසලේ වර්ෂාවසාන නිවාඩු දීමට පෙර ත්‍යාග ප්‍රදාන උත්සවය, වර්ණ ප්‍රධාන උත්සවය ආදිය පමණක් නොව ගුරුවරුන්ගේ විවිධ දක්ෂතා ඇගයීමට ලක්කරන අතර විනයානුකූලව කටයුතු කළ ශිෂ්‍ය නායක නායකයින් ද ඇගයීමට ලක් කරයි. පන්තිභාර ගුරුවරුන් සමඟ විනය ගැටලු ඇති සිසුන් සඳහා අවධානය යොමු කරමින් උපදෙස් දීම හා නව වර්ෂයට නිවැරදි වීමට ද අවවාද කරයි. එපමණක් නොව, රජයේ විභාග වන පහ වසර, අ.පො.ස (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) ජාතික මට්ටමේ පරීක්ෂණවලදී ඉහළ සාමාර්ථයක් ලබා ගත් සිසුන්ගේ තොරතුරු පුවත්පත්වලට ඉදිරිපත් කිරීමට ද අමතක නොකරයි. දරුවන්ගේ සෞඛ්‍ය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වන අතර වසංගත රෝග බෝවීම මැඩලීමට ද විවිධ වැඩසටහන් දියත් කරයි.''

ඉහත ප්‍රකාශය තුළ එම විදුහලේ විදුහල්පති ගේ කාර්යයන් වෙන්කර හඳුනාගෙන එම කාර්යයන් එක් එක් භූමිකා වලට වෙන් කර දක්වන්න. (ලකුණු 4)

(v) (අ) නිෂ්පාදන සැලසුම්කරණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) පහත සඳහන් වන්නේ කිසියම් නිෂ්පාදන ක්‍රමයකට අදාළ ලක්ෂණයන් ය. එම ලක්ෂණ අධ්‍යයනය කර, ඊට අදාළ නිෂ්පාදන ක්‍රමය උදාහරණයක් ලියන්න. එම ක්‍රමයේ හිතකර හා අහිතකර ලක්ෂණ දෙක බැගින් ලියන්න.

නිර්ණායක :

1. නිමැවුම් ප්‍රමාණය - ඉතා පහලයි.
2. නිෂ්පාදිතය - විවිධයි.
3. නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලී බව - ඉතා ඉහළයි. (ලකුණු 2)

06. පහත තොරතුරු යොදාගනිමින් සමච්ඡේදන ඒකක ප්‍රමාණය සමීකරණය ඇසුරින් සොයන්න.

විකුණුම් ඒකක ප්‍රමාණය 5000

ස්ථාවර පිරිවැය රුපියල් 100,000

ඒකකයක සෘජු පිරිවැය

ද්‍රව්‍ය රු. 35

ශ්‍රම පිරිවැය රු. 15

ඒකකයක විකුණුම් මිල රුපියල් 100 (ලකුණු 4)

(ii) (අ) නිෂ්පාදන කළමනාකරණයට අයත් ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලියට යටත් කරුණු පෙළගස්වන්න. (ලකුණු 2)

(ආ) නිෂ්පාදන කටයුතුවලදී මිලදී ගන්නා ද්‍රව්‍ය හා සේවා වෙන වෙනම ලියන්න. (ලකුණු 2)

(iii) (අ) නිෂ්පාදන ආයතනයක් විශේෂයෙන් ම අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් ලෙස ප්‍රශස්ත තොග මට්ටම් පවත්වා ගෙන යාම දැක්විය හැක. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 2)

(ආ) (i) තොග පිරිවැය වර්ග නම් කරන්න.

(i) ආර්ථික ඇණවුම් ප්‍රමාණය යනු කුමක්ද? (ලකුණු 2)

(iv) (අ) ''පිලිප් කොට්ලර්'' ඉදිරිපත් කර ඇති ආකාරයට අලෙවිකරණය අර්ථ දක්වන්න. (ලකුණු 2)

(ආ) පාරිභෝගික තෘප්තිය උපරිම කිරීම තුළින් ආයතනයකට අත්කරගත හැකි වාසි මොනවාද?(ල. 2)

(v) (අ) අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණ මොනවාද? (ලකුණු 2)

(ආ) ගැනුම්කරුවන් භාණ්ඩ මිලදී ගැනීමේදී සලකා බලන ප්‍රධානම සාධකය මිල වේ. මිල කිරීමේ පරමාර්ථ මොනවාද? (ලකුණු 2)

07. (i) (අ) ව්‍යාපාරිකයාට, පාරිභෝගිකයාට මෙන්ම ආර්ථිකයටද, අලෙවිකරණය වැදගත් වේ. එලෙස ආර්ථිකයට අලෙවිකරණයේ වැදගත්කම පහදන්න. (ලකුණු 2)

(ආ) ''ස්ථාන මිශ්‍රය'' හඳුන්වන්න. (ලකුණු 2)

(ii) 'ඇසුරුම්කරණය' හඳුන්වා ඇසුරුමක් තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) (අ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් නම් කරන්න. (ලකුණු 2)

(ආ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය හඳුන්වා, එහිදී අවධානය යොමු කරනු ලබන අංග 4 නම් කරන්න. (ලකුණු 2)

(iv) (අ) මූල්‍ය කළමණාකරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්යය හා අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග විවිධ නිර්ණායක යටතේ වර්ගීකරණය කළ හැක. එම වර්ගීකරන දෙකක් යටතේ අරමුදල් සම්පාදන මාර්ග වර්ගකර නිදසුන් ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

(ආ) ආයෝජන තීරණ යනු මොනවාද? (ලකුණු 2)

08. (i) (අ) අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි හා සීමා දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ද්‍රවශීලතා අනුපාත යනු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) (අ) ආර්ථිකයක මූල්‍ය පද්ධතියේ සංයුතිය කවරේද? (ලකුණු 2)

(ආ) කොටස් වෙළඳපළ හා සම්බන්ධ 'සමථ දිනයක්' යනු කුමක්ද? (ලකුණු 2)

(iii) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iv) (අ) අනෙකුත් සම්පත් වලට සාපේක්ෂව මානව සම්පතේ ඇති සුවිශේෂී තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) රැකියා නිර්මාණය හා රැකියා විශ්ලේෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(v) (අ) ව්‍යාපාර ආයතනයක් අනාගත මානව සම්පත පුරෝකතනය කිරීමේදී සලකා බලන කරුණු නම්කරන්න. (ලකුණු 2)

(ආ) ආයතනයේ සේවකයින් පිරිසක් සති කිහිපයක් තිස්සේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක යෙදී සිටී. එය සමථයකට පත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග නම් කරන්න. (ලකුණු 2)

# දෙවන වාර පරීක්ෂණය - 2019
# 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
# I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) | - 3 | (11) | - 2 | (21) | - 4 |
| (02) | - 4 | (12) | - 1 | (22) | - 4 |
| (03) | - 1 | (13) | - 2 | (23) | - 3 |
| (04) | - 5 | (14) | - 3 | (24) | - 2 |
| (05) | - 2 | (15) | - 4 | (25) | - 3 |
| (06) | - 5 | (16) | - 2 | (26) | - 2 |
| (07) | - 3 | (17) | - 1 | (27) | - 2 |
| (08) | - 3 | (18) | - 4 | (28) | - 3 |
| (09) | - 3 | (19) | - 5 | (29) | - 4 |
| (10) | - 4 | (20) | - 3 | (30) | - 4 |

31. (අ) අභ්‍යන්තර, සාර්ව (ආ) සුළු හා මධ්‍ය පරිමාණ, මහා පරිමාණ
32. (අ) මානව සම්පත් කළමනාකරණයට, නිෂ්පාදනයට (ආ)Reuse , Reduce
33. (අ) අභ්‍යන්තර මිල ස්ථායිතාව, බාහිර මිල ස්ථායිතාව
(ආ) වර්තන වියදමට, ප්‍රාග්ධන වියදම්
34. (අ) නියෝජිතයෙකු (ආ) ප්‍රධානියෙකු
35. (අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(ආ) ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.
36. (අ) සඵලදායී සන්නිවේදනය (ආ) ඉන්ටර්කොම්
37. (අ) සඵලදායකත්වය (ආ) කාර්යක්ෂමතාවය
38. 2- ක්‍රියාපටිපාටිය 3- තාක්ෂණය
39. (අ) ගුණත්වය, අංගෝපාංග, නිමාව. (ආ) මහජන සම්බන්ධතා
40. (අ) මූලික ප්‍රසිද්ධ නිකුතුව මගින්, විකුණුම් අර්පණය මගින් හඳුන්වා දීමක් මගින්.
(ආ) ප්‍රධාන පුවරුව, දිරිසවි පුවරුව
41. 1. ගුරු සේවය 2. නීතිඥ සේවය 3. වෛද්‍ය සේවය 4. විගනන සේවය 5. පිළිගත හැකි වෙනත් පිළිතුරු
42. 1. ගනුදෙනුකරුවන් 2. අයිතිකරුවන් 3. සමාජය 4. සේවකයින්
43. 1. ණය කාඩ්පත් හිමියා 2. ණය කාඩ්පත් සංගමය 3. ණය කාඩ්පත් නිකුතු බැංකුව/ මූල්‍ය ආයතනය 4. අනුමත වෙළඳසැල්
44. 1. නිෂ්පාදිත වගකීම් රක්ෂණය 2. මහජන වගකීම් රක්ෂණය 3. සේව්‍ය වගකීම් රක්ෂණය 4. වෘත්තීය වගකීම් රක්ෂණය
45. 1. භාණ්ඩයේ ස්වභාවය 2. වේගය 3. පිරිවැය 4. දුර ප්‍රමාණය 5. ධාරිතාව 6. සුරක්ෂිතතාව
46. 1. භාණ්ඩ තොග වශයෙන් සැපයීම 2. සිල්ලර වෙළඳසැලට භාණ්ඩ ගෙනැවිත් භාරදීම 3. ණය පහසුකම් සැපයීම 4. භාණ්ඩ තේරීම, ඇසිරීම, මිශ්‍ර කිරීම ආදී සේවාවන්හි නිරත වීම
47. 1. අණකිරීමේ ඒකීයතාවය/දාමය 2. ධූරාවලිය 3. පාලන අවකාශය/ කළමනාකරණ අවකාශය 4. මධ්‍යගතකරණය හෝ විමධ්‍යගතකරණය 5. නීතිරීති 6. ක්‍රියාපටිපාටි 7. සමායෝජනය
48. 1. තහවුරු ප්‍රචාරනය 2. ජීවන ශෛලී ප්‍රචාරනය 3. නැවත නැවත ප්‍රචාරනය 4. විස්තරාත්මක ප්‍රචාරනය
49. 1. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොල 2. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ 3. වාණිජ පත්‍රිකා වෙළඳපළ 4. අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ
50. 1. සේවක ඵල දායකත්වය වර්ධනය කිරීම 2. සේවක පිරිවැය පාලනය කිරීම
3. සේවක සංවර්ධනය ඇති කිරීම 4. සේවකයින් සම්බන්ධ නීතිමය කොන්දේසි සපුරාලීම
5. සේවක සුබසාධනය 6. සේවකයින් අභිප්‍රේරණය කිරීම
7. සේවකයින් ආයතනයේ රඳවාගැනීම 8. සේවකයින් බඳවා ගැනීම

# දෙවන වාර පරීක්ෂණය - 2019
# 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු - II පත්‍රය

01. (i) ව්‍යාපාරයක් වියදම ඉක්මවා ලබන ආදායම ලාභය වන අතර බහුතර ව්‍යාපාර වල ප්‍රධාන අරමුණ වන්නේ ලාභය උපරිම කිරීමයි. ව්‍යාපාරයේ අනාගත පැවැත්ම තීරණය කරන සාධකයක් ලෙස මෙන්ම ව්‍යාපාරයේ සංවර්ධනය තීරණය කරන සාධකයක් ලෙස ද මෙය දැකිය හැකි ය. එබැවින් බහුතර ව්‍යාපාරවල ගති ලක්ෂණයක් ලෙස මෙය දැකිය හැකි වන අතර, සමහර ව්‍යාපාර ලාභ අරමුණින් තොරවද කටයුතු කරයි.

(පැහැදිලි කිරීමට ලකුණු දෙකයි)

(ආ)* වෙනස් වන දේශපාලනික හා ආර්ථික තත්ත්වයන්ට අනුවර්තනය වීමට.
* තාක්ෂණික වර්ධනයන්ට අනුගත වීමට.
* ගෝලීයකරණ තත්ත්වයන්ට අනුවර්තනය වීමට.
* නව කළමනාකරණ ශිල්පීය ක්‍රමවේදයන් යොදාගැනීමට.
* වෙනස්වන පාරිභෝගික චර්යාවන්ට ප්‍රතිචාර දැක්වීමට.
* සමාජීය හා පාරිසරික වෙනස්කම් වලට අනුගත වීමට.
* නෛතික විධි විධානයන්ගේ වෙනස්කම්වලට අනුගතවීමට. (ගැළපෙන කරුණු 4කට ලකුණු දෙකයි)

(ii)(අ) ව්‍යාපාර = කර්මාන්ත + වාණිජ්‍යය
වන අතර
වාණිජ්‍යය = වෙළඳාම + උපකාරක සේවා වේ.
එම නිසා ව්‍යාපාර හා වාණිජ්‍යය යන වචන සමාන අර්ථයක් ගෙන නොදේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) කෘෂිකාර්මික 6.9% කාර්මික 26.8% සේවා 56.8% ආර්ථික වර්ධන අනුපාතය 3.1%
(කරුණු හතරක් නිවැරදිව දැක්වීමට ලකුණු 2)

(iii) වර්ථමාන ලෝකයේ පවතින දැඩි තරගකාරීත්වයට මුහුණ දීමට ව්‍යාපාර තම පිරිවැය අඩුකර ගැනීමේ අත්‍යවශ්‍ය බවක් පවතී. මේ නිසා ව්‍යාපාර ලෝකය තුළ අඩු පිරිවැය ශ්‍රමය සොයමින් වෙහෙසෙයි. බහුතර කර්මාන්තශාලා චීනය වැනි ජනගහනය ඉහළ, අඩු පිරිවැය ශ්‍රමය ඇති රටවල නිෂ්පාදකයින් විසින් ස්ථාපිත කරන්නේ මෙම අඩු පිරිවැය තත්ත්වය නිසාවෙනි. (පැහැදිලි කිරීමට ලකුණු හතරයි)

(iv) (අ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු : * නිෂ්පාදන වැඩිදියුණු කිරීම. * අඩු පිරිවැය ක්‍රම සොයාබැලීම. * නව නිර්මාණ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම. * වෙළඳපළ පර්යේෂන කටයුතු.
තොරතුරුකළමණාකරණ කටයුතු : * නව තොරතුරු එක්රැස් කිරීම. * තොරතුරු පද්ධති පවත්වාගෙන යාම. * තොරතුරු අවශ්‍ය පාර්ශව වෙත බෙදාහැරීම. * තොරතුරු යාවත්කාලීන කිරීම.
(එක් කොටසකින් කරුණු2 බැගින් කරුණු 4ක් දැක්වීමට ලකුණු 2යි)

(ආ) * තමන් ආයෝජනය කළ මුදලේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත්වීම. * ආයෝජනය කළ මුදලට සරිලන ප්‍රතිලාභයක් ලැබේදැයි සොයාබැලීම. * ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳව දැනගැනීමට. * වෙළඳපොළ කොටස පිළිබඳව දැනගැනීමට. (කරුණු 4කට ලකුණු 2)

(v) (අ) සංවිධානමය සංස්කෘතිය තුළ ඇති ව්‍යාපාරයට ආවේණික වූ විශ්වාසයන්, අගභිගකම්, වටිනාකම්, සිරිත් විරිත් ආදිය ව්‍යාපාර කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපායි නම්, ව්‍යාපාරය තුළ අකාර්යක්ෂමතාවයන් නිර්මාණය කරයි නම් ඒවා ව්‍යාපාරික අරමුණු සඵල දායි ලෙස ළඟා කර ගැනීමට බාධා ඇති කරයි නම් එය ව්‍යාපාරයට දුර්වලතාවයන් නිර්මාණය කරයි. (පැහැදිලි කිරීමට ලැබුණු දෙකයි)

(ආ) හඳුනාගත් ශක්තීන් හා අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගෙන දුර්වලතා හා තර්ජන මැඩ පැවැත්වීමට හෝ අවම කිරීමට කටයුතු යෙදිය යුතුයි. (පැහැදිලි කිරීමට ලකුණු දෙකයි)

02. (i) * විවිධ මූල්‍යමය වංචාවන් සිදු කිරීම. * ව්‍යාපාරික රහස් සොරාගැනීම.
* බාහිර පාර්ශවයන් නොමග යවන වැරදි තොරතුරු ලබාදීම. * සේවක දක්ෂතා යටපත් කිරීම* චරපුරුෂ සේවා පවත්වා ගැනීම. * වෙළඳ ලකුණු, පේටන්ට් අයිතීන් වංචනිකව යොදාගැනීම.
* සමාගමේ දේපල ලාභ ආදිය අවභාවිත කිරීම. * පරිසර දූෂණය සිදු කිරීම.(ගැලපෙන කරුණු 8 කට ලකුණු 4)

(ii) (අ) යම් පුද්ගලයකුගේ හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන්ම ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි. පුද්ගල ආදායම් බදු, සමාගම් බදු, රඳවා ගැනීමේ බදු, ප්‍රාග්ධන ලාභ මත බදු. (ලකුණු 2)

(ආ) වාණිජ බැංකු පොලී අනුපාතය පහලට යන විට, වාණිජ බැංකු විසින් ණය සඳහා අයකරන පොලිය අඩුවීම නිසා ව්‍යාපාරිකයින් අඩු පොලියට පහසුවෙන් ණය ලබා ගනී. එම නිසා ව්‍යාපාර වල ආයෝජනය වැඩි වී නිෂ්පාදනය වැඩි කර ගත හැකි වීමෙන් ව්‍යාපාර පුළුල් කර ගත හැකි වේ. (ලකුණු 2)

(iii) (අ) * විචාරාත්මක දැනුවත්භාවය * සක්‍රිය සහභාගිත්වය * සමාජය ගැන සැලකිලිමත්වීම. * පරිසරය පිළිබඳ සැලකිලිමත්වීම. * සහයෝගීතාව (ලකුණු 2)

(ආ) * පොලී අනුපාතිකය. * සංචිත අවශ්‍යතා වෙනස් කිරීම * විවෘත වෙළඳපොළ කටයුතු * වට්ටම් අනුපාත වෙනස්කිරීම. * ණය සීමා පැනවීම (ලකුණු 2)

(iv) (අ) (i) සංස්ථාපිත පුද්ගලික සමාගම් (ලකුණු එකයි)
(ii) ලක්ෂණ - වගකීම සීමිත වීම, නෛතික පුද්ගල බව, අඛණ්ඩව පැවැත්ම, ලියාපදිංචි අනිවාර්ය වීම, ගිණුම් තැබීම අනිවාර්ය වීම, කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස් කළ හැකි වීම,
(කරුණු හතරකට භාගය බැගින් 4 ට ලකුණු එකයි)

(ආ)

| **හවුල් ව්‍යාපාරය** | **සංස්ථාපිත පෞද්ගලික සමාගම** |
|---|---|
| * ප්‍රාග්ධනය හවුල්කරුවන් මගින් සපයා ගනී | * ප්‍රාග්ධනය කොටස් කරුවන් ගෙන් සපයාගනී |
| * පාලනය හවුල්කරුවන් මගිනි | * පාලනය කොටස් කරුවන් ගෙන් තේරීපත්වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි |
| * වගකීම - අසීමිතයි. | * වගකීම - සීමිතයි. |
| * නෛතික පුද්ගල බවක් නැත. | * නෛතික පුද්ගල බවක් ඇත.(නිවැරදි සැසඳීම්4 කට ලකුණු 2) |

(v)(අ) ඇපයෙන් සීමිත සමාගම් (ලකුණු භාගයයි)
(ආ) * කොටස් නිකුත් කිරීම සිදුනොවේ. * සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමේදී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වේ. * පොදු පරමාර්ථයෙන් සමාගම ආරම්භ වීම. * අවම දෙකයි උපරිම සංඛ්‍යාව අසීමිත වේ. * ලාභ බෙදීමක් නොමැත.

03. (i) (අ)

| රාජ්‍ය සංස්ථා | රාජ්‍ය සමාගම |
|---|---|
| * මහජන බැංකුව | * ශ්‍රී ලංකා රක්ෂණ සමාගම |
| * පාරිභෝගික කටයුතු අධිකාරිය | * සීමාසහිත විදුලිබල මණ්ඩලය |
| * තරුණ සේවා සභාව | * ලංකා හොස්පිටල්ස් |
| * මහවැලි අධිකාරිය | |
| * ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය. | |

(සංස්ථාවල පහම හරිනම් ලකුණු 1, 3-4 හරිනම් ලකුණු භාගයයි, 3 ට අඩු නම් ලකුණු නැත.
සමාගම්වල තුනට 1, 2 ට භාගයයි)

(ආ) (i) රාජ්‍ය දෙපාර්තමේන්තු

(i)

| ලක්ෂණ | අකාර්යක්ෂමතා |
|---|---|
| * වගකීම් අසීමිත වීම | * ආයතන සංග්‍රහ හා චක්‍රලේඛ නිසා ක්ෂණික තීරණ ගැනීම අපහසු වීම. |
| * අයිතිය රජය සතු වීම | * නිලධාරිවාදය තදින් ක්‍රියාත්මක වීම. |
| * පාලනය පාර්ලිමේන්තු හා අමාත්‍යංශ පාලනය | * රජයේ පරිපාලන නිලධාරීන් මෙහෙයවීම |
| * ලාභාලාභ රජය දරාගැනීම | * ආයතනය හා සේවකයන් අතර බැඳීම් අඩුවීම. |
| * ආයතන සංග්‍රහ මූල්‍ය නීති හා චක්‍රලේඛ වලට අනුව පාලනය | * අයවැය ප්‍රතිපාදන මත යැපීම |

(නම් කිරීමට ලකුණු එකයි , ලක්ෂණ දෙකකට භාගය බැගින් දෙපැත්තේ කරුණු 4 ට ලකුණු එකයි)

(ii)(අ)1. අභ්‍යන්තර ව්‍යවසායකත්වය 2. ගෝලීය ව්‍යවසායකත්වය 3. සමාජයීය ව්‍යවසායකත්වය 4. හරිත ව්‍යවසායකත්වය (4ක් නම් කිරීමට ලකුණු 1 , 2ක් පැහැදිලි කිරීමට ලකුණු 1, 4 නම්කර දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ)

නව්‍යතා සොයාගැනීම
↓
සංකල්ප ගොඩනැඟීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම
↓
අවශ්‍ය සම්පත් සම්පාදනය
↓
යථාර්ථයක් බවට පත්කර ගැනීම
↓
ප්‍රතිලාභ ලැබීම (පියවර පිළිවෙලින් ඇති පිළිතුරට ලකුණු 2)

(iii)

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| නවෝත්පාදකයෙකි | සාම්ප්‍රදායිකයෙකි. |
| අවදානමට මුහුණ දේ | ආරක්ෂාකාරීව කටයුතු කරයි. |
| ගැටලු පිටුදැකීමට ධෛර්යමත්ව කටයුතු කරයි. | ගැටලු ඇති වූ විට අධෛර්යයට පත්වෙයි. |
| පිළිගත හැකි වෙනත් | |

(කරුණු 4ට ලකුණු හතරයි)

(vi) (අ) මූල්‍ය ආයතන අතර සිදුවන වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු සහ ඉතා හදිසි ගනුදෙනු ක්ෂණිකව පහසුවෙන් හා විශ්වාසයෙන් යුක්තව සිදුකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වාදුන් නවීන විද්‍යුත් ගෙවීම් හා පියවීම් පද්ධතිය තත්කාලීන දළ පියවීම් පද්ධතිය ලෙස හඳුන්වයි.
තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිකරුවන් :
1. ශ්‍රී ලංකා මහ බැංකුව 2. බලපත්‍රලාභී වාණිජ බැංකු 3. රාජ්‍ය සුරකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්
4. සේවක අර්ථසාධක අරමුදල (හඳුන්වා පාර්ශව නම් කිරීමට ලකුණු 2)

(ආ) 1. අණකරුට ලිඛිතව දැනුම්දී චෙක්පතෙහි අය ලබාගැනීමට කටයුතු කිරීම.
2. ලිඛිත දැනුම් දීමට පිළිතුරක් නොමැති නම් නඩු නොදැමීමට හේතු දක්වන ලෙස දක්වා නීතිඥයෙකු ලවා එන්තරවාසියක් යැවීම.
3. එන්තරවාසිය ට ද පිළිතුරක් නොමැති නම් නඩු පැවරිය හැකි වීම. (කරුණු 2 ට ලකුණු 2)

(v) (අ) 1. අපනයන ප්‍රමාණය වැඩි වීම තුළින් අපනයන ආදායම වැඩි විය හැකිය 2. ආනයන ප්‍රමාණය අඩු වීම තුළින් ආනයන වියදම් අඩු විය හැකිය. 3. නිෂ්පාදන පිරිවැය ඉහළ යා හැකිය. 5. විදේශීය අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හා විදේශීය භාණ්ඩ මිල ඉහළ යාම 5. ගෙවුම් තුලනය යහපත්වීම. (කරුණු 2 ක් ලකුණු 2)

(ආ) 1. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම - ලයනල් තම මෝටර් රථය නාරායනට් අලෙවි කිරීම. 2. වටිනාකම මිනුම් දණ්ඩක් වීම - මෝටර් රථයේ වටිනාකම රුපියල් මිලියන දහයක් වීම. 3. වටිනාකමේ සන්නියක් වීම - ලයනල් මිලියන තුනක් බැංකුවේ තැන්පත් කිරීම. 4.විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම - ඉතිරි මිලියන 7 මාස දෙකකින් ගෙවීමට නාරායන එකඟවීම.

04. (i) * අවදානම පුරෝකතනය කළ හැකි වීම. * අහඹු ලෙස සිදුවීම. * සම්බන්ධතාවයකින් තොරවීම. * සත්‍යාපනය කළහැකිවීම (ලකුණු 2)

(ආ) රක්ෂණය මගින් කිසිසේත් අවදානම් වැළැක්විය නොහැකි වන අතර අවදානම් ඇතිවූ පසු ඉන් ඇතිවන හානි යම්තාක් දුරට ප්‍රතිපූර්ණය කර ගැනීමට පමණක් අවකාශ සලසයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ii) (අ) රසික පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණද ඔහු විසින් එය තුළ ගංවතුර හා ස්වභාවික උවදුරු සඳහා ආවරණයක් ඇතුළත් වගන්තියක් ඇතුළත් කරගෙන නොමැති විට රක්ෂණ සමාගමට ගෙවීම ප්‍රතික්ෂේප කළ හැක. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) 1. නිවැරදි හා ප්‍රමාණවත් තොරතුරු මත තීරණ ගැනීම සිදුකළ හැකි වීම.
2. ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට අවශ්‍ය උපදෙස් ලබාදීමට හැකිවීම 3. සමාන මට්ටමේ අංශ අතර තොරතුරු හුවමාරු කරගත හැකිවීම. 4. බාහිර පාර්ශව සමඟ තොරතුරු හුවමාරු කරගත හැකි වීම. 5. ව්‍යාපාර තීරණවල දී කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට හැකිවීම 6. විවිධ ප්‍රතිලාභ පිළිබඳව අත්‍යවශ්‍ය තොරතුරු ලබාදීමට හැකිවීම. (කරුණකට භාගය බැගින් කරුණු 4 කට ලකුණු 2)

(iii) 1 විද්‍යුත් තැපැල email 2 හඬ තැපැල voice mail 3 කෙටි සංවාද පහසුකම් chatting 4 මුහුණු පොත facebook 5 කෙටි පණිවිඩ සේවය sms 6 අන්තර්ජාලය internet 7 ඉන්ට්‍රානෙට් intranet
(කරුණු 4ක් නම්කර ඉන් දෙකක් විස්තර කිරීමට ලකුණු දෙකයි)

(iii) (අ) නිෂ්පාදකයා → පාරිභෝගිකයා
නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා
නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා
නිෂ්පාදකයා →නියෝජිතයින් → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා
(ලකුණු 2)

(iv) (අ) * ස්වභාවික සම්පත් බෙදීයාමේ විෂමතාව. * සාපේක්ෂක පිරිවැය වාසිය. * සමහර නිෂ්පාදිත සම්බන්ධව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම . * භාණ්ඩ ප්‍රවර්ධනය. * වෙළඳ බාධක අවමවීම.(ලකුණු 2)

(ආ) *අන්තර්ජාලය ඔස්සේ ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම. * වෙළඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම. * භාණ්ඩ විකිණීමේ හා මිලදී ගැනීමේ කටයුතු සිදු වීම. * ගනුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම. (ලකුණු දෙකයි)

(v) * **<u>ණයවර ලිපි මගින් :</u>** - ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරු වෙනුවෙන් ඔහුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත ණයවර ලිපිය නිකුත් කිරීම මගින්.
* **<u>බැංකු අණකර මගින්</u>** - යම් පුද්ගලයකු විසින් සිය බැංකුවට අදාල මුදල හා නියමිත ගාස්තු ගෙවා දෙන ලද උපදෙස් පරිදි නම් කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් ලැබිය යුතු තැනැත්තාට ගෙවන ලෙස අණ කරමින් මුදල් යවන්නාගේ බැංකුව විසින් මුදල් ලැබිය යුතු තැනැත්තාගේ බැංකුවට හෝ නියෝජිත බැංකුවට නිකුත් කරන ලියවිල්ලයි.
* **<u>විද්‍යුත් ගෙවීම් ක්‍රම මගින්</u>** - ණය කාඩ්පත, අන්තර්ජාල පෙරගෙවුම් කාඩ්පත්, අන්තර්ජාල පෙර ගෙවුම් පහසුකම්.
* **<u>විද්‍යුත් ගෙවීම් සේවා ආයතන හරහා ගෙවීම</u>** - යම් ගෙවීමක් කිරීමේදී අදාළ භාණ්ඩය හෝ සේවාව ලබාගත් ආයතනයට සෘජුවම ගෙවීම් නොකර පිළිගත් ගෙවීම් ආයතනයක් හරහා ගෙවීම් කිරීමේ ක්‍රමයකි.(ලකුණු 2)
නිද :- www.paypal.com


05. (i) (අ) පුද්ගල අපේක්ෂා බලාපොරොත්තු ආකාරයට ඉටු කරගැනීමට. * කාල කළමනාකරණයට. * පුද්ගල ආදායම් වියදම් පාලනයට. * කාර්යක්ෂමතාවය වර්ධනය කරගැනීමට. (කරුණු 4 ට ලකුණු 2)


(ආ) විවිධ අවස්ථාවලදී නිතර නිතර වෙනස්වීම් වලට භාජනය වන අභ්‍යන්තර හා බාහිර පරිසරයයි.(ල දෙකයි)

(i) (අ) කෙටි කලක් තුළ ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂාවන් අරමුණු වන අතර මෙය කාලය සමඟ සම්බන්ධ වන්නා වූ ප්‍රමාණාත්මක මිනුම් ලෙස දැක්විය හැක. ( ලකුණු 1)

S - නිශ්චිත බව.
M- මැනිය හැකි වීම.
A- ළඟා කරගත හැකිවීම
R- යථාර්ථවාදී බව
T- නිශ්චිත කාල සීමාවක් දක්වා තිබීම (කරුණු දෙකකට ලකුණු භාගය බැගින් කරුණු 4 ට ලකුණු එකයි)

(ආ) සිරස් සංවිධාන සටහනකි. (ලකුණු එකයි)



(මෙයින් එක් ක්‍රමයක් දක්වා ඇත්නම් ලකුණු එකක් දෙන්න)

(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකයා. (ලකුණු එකයි)

(ආ) කැපවීම, බුද්ධිමත් බව, ආත්ම විශ්වාසය, අධිෂ්ඨානය, අන්‍ය මත ගරු කිරීම.

(නායකත්වය නම් කිරීමට ලකුණු බාගයයි ලක්ෂණ පහ දැක්වීමට කරුණු 5 ට ලකුණු 3, 4ට 2යි, 3ට 1යි, 3ට අඩුනම් ලකුණු නැත)

(iv) 1. ප්‍රධානියා ලෙස - ත්‍යාග ප්‍රදානෝත්සවය.
2. නායකයා ලෙස - වර්ණ ප්‍රදානෝත්සවය, ගුරු දක්ෂතා අගැයීම, නායක නායිකාවන් ඇගයීම.
3. බාධා පාලනය කරන්නා - විනය ගැටලු පිළිබඳ අවධානය යොමු කර උපදෙස් දීම.
4. තොරතුරු බෙදාහරින්නා - විභාග සමත් සිසුන් පිළිබඳව පුවත්පත්වලට වාර්තා සැපයීම.
5. ව්‍යවසායකයා - රෝග පිළිබඳ විවිධ වැඩසටහන් දියත් කිරීම.

(හතරක් නම් කර අදාළ කරුණු දක්වා ඇත්නම් ලකුණු හතරයි,නිවැරදි භූමිකා නම් කිරීමට හා අදාළ කරුණක ල1 බැගින්)

(v)නිෂ්පාදන ආයතනයක් සිය නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය යන්ත්‍රාගාර, යන්ත්‍රසූත්‍ර, ශ්‍රමය ආදී අවශ්‍යතා තීරණය කරමින් සකස් කරනු ලබන වැඩසටහන කෙටිකාලීනව හා දිගුකාලීනව සැකසීමයි.(සම්පූර්ණ පිළිතුරට ලකුණු දෙකයි)

(ආ) කාර්ය නිෂ්පාදනය - උදා : මංගල ඇඳුම්, මංගල හා උපන්දින කේක්.

| **හිතකර ලක්ෂණ** | **අහිතකර ලක්ෂණ** |
|---|---|
| * ගනුදෙනුකරු අවශ්‍යතා හා උවමනා වලට අනුව නිපදවීම. | * පිරිවැය ඉහළ යාම |
| * පාරිභෝගික තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගත හැකිවීම | * විශේෂීකරණ මෙවලම් හා උපකරණ අවශ්‍ය වීම. |

(ක්‍රමය නම් කිරීමට හා උදාහරණයට ලකුණු 1, හිතකර ලක්ෂණ දෙකකට ලකුණු භාගයයි, අහිතකර ලක්ෂණ 2 ට ලකුණු භාගයයි, මුළු ලකුණු 2)

06. (i) 1සමච්ඡේදන ඒකක සංඛ්‍යාව = $\frac{\text{මුළු ස්ථාවර පිරිවැය}}{\text{ඒකකයක දායකය}}$

$= \frac{100000}{50}$

සමච්ඡේදන ඒකක සංඛ්‍යාව = 2000 (නිවැරදිව සූත්‍රය දැක්වීමට ලකුණු දෙකයි, නිවැරැදි පිළිතුරට ලකුණු 2)

(ii) (අ) * ද්‍රව්‍ය අවශ්‍යතා මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුවට දැනුම් දීම. * සැපයුම්කරුවෙකු සොයාගැනීම. * ඇණවුම් කිරීම * භාණ්ඩ ලැබීම * මුදල් ගෙවීම (කරුණු හතරක් සඳහන් කරඇත්නම් ලකුණු 2)

(ආ) ද්‍රව්‍ය - අමුද්‍රව්‍ය, ප්‍රාග්ධන උපකරණ, අංගෝපාංග, ඉන්ධන
සේවා - ආරක්ෂක සේවා, නඩත්තු සේවා, ප්‍රවාහන සේවා, පවිත්‍ර සේවා, ජලය, විදුලිය
(නිවැරදිව සේවා නම් කිරීමට ලකුණු 1, උදාහරණ දෙක බැගින් හතරක් දැක්වීමට ලකුණු 1)

(iii)(අ) ප්‍රශස්ථ තොගය යනු ඌන හෝ අතිරික්ත නොවන තොගයකි. ඌන තොගයක් තුළින් නිෂ්පාදන අඛණ්ඩව පවත්වාගෙන යා නොහැකි අතර වෙළඳපළ අවශ්‍යතා සැපිරීමට නොහැකි තත්ව, පිරිවැය වැඩි වන අතර අතිරික්ත තොග පවත්වාගෙන යාම මගින්ද තොග නාස්තිවීම්, යල්පැනීම් නඩත්තු පිරිවැය වැඩිවීම් ආදිය තුළින් පිරිවැය වැඩිවීම ලාභය අඩු වීම, වෙළඳපළ බිඳවැටීම් ආදිය නිසා ප්‍රශස්ථ තොගය පවත්වාගෙන යාම වැදගත් වේ.
(සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(ආ) (i) තොග ඇණවුම් පිරිවැය , තොග පවත්වාගෙන යාමේ පිරිවැය. (ලකුණු 1)

(ii)ආයතනයක තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වන පරිදි වරකට ඇණවුම් කළයුතු තොග ඒකක ප්‍රමාණයයි. (ලකුණු එකයි)

(iv) (අ) ''පුද්ගලයින් හා කණ්ඩායම් සිය අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා වෙනත් අය මගින් නිර්මාණය කිරීම, ඉදිරිපත් කිරීම හා නිදහසේ හුවමාරු කිරීම පිළිබඳව සමාජීය ක්‍රියාවලියකි''
(මෙම පිළිතුරුට ලකුණු 2)

(ආ) 1. පාරිභෝගික පක්ෂපාතීත්වය වර්ධනය වීම. 2. තරගකාරී භාණ්ඩ වලට පාරිභෝගිකයා ඇදීයාම අඩුවීම. 3. ගනුදෙනුකරු ආයතනය හා නිෂ්පාදිත සම්බන්ධව සුබවාදී වීම. 4. කීර්තිනාමය වර්ධනය වීම. 5. පිළිගත හැකි වෙනත් (කරුණු 4කට ලකුණු 2)

(v) (අ) ප්‍රචාරණය, විකුණුම් ප්‍රවර්ධනය, පෞද්ගලික විකුණුම්, මහජන සම්බන්ධතා, ඍජු අලෙවිකරණය, ඉසව් හා අත්දැකීම්. (කරුණු 4 ට ලකුණු 2)

(ආ) * වෙළඳපොළ තුළ රැඳී සිටීම. * වර්තමාන ලාභ උපරිම කිරීම. * වෙළෙඳපොළ කොටස උපරිම කිරීම, *වෙළඳපොළ සාරය උරා ගැනීම. * නිෂ්පාදිත ගුණාත්ව නායකත්වය.(කරුණු 4 ට ලකුණු දෙකයි)

07. (i) (අ) 1. නිෂ්පාදන විවිධාංගීකරණය ඇතිවීම 2. නිෂ්පාදනය පුළුල් වීම 3. සේවා නියුක්තිය ඉහළ යාම 4. ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම වීම 5. රටේ ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට මග පෑදීම 6. පිළිගත හැකි වෙනත්. (ලකුණු 2)

(ආ) ඉලක්ක වෙළඳපොලේ පාරිභෝගිකයන් උපරිම ලෙස තෘප්තියට පත් කරමින් ව්‍යාපාරයේ පිරිවැටුම උපරිම කර ගැනිමට හැකිවන පරිදි නියම ප්‍රමාණයෙන් නියම වේලාවට අවශ්‍ය ස්ථානයේ දී භාණ්ඩ සැපයීම සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් සමූහය ස්ථාන මිශ්‍රයට අයත් වේ. (ලකුණු දෙකයි)

(ii) භාණ්ඩක දැවටුම හෙවත් මතුපිට ආවරණය හෝ බහාලුව නිර්මාණය කිරීමේ හා නිපදවීමේ ක්‍රියාවලිය ඇසුරුම්කරණය ලෙස හැඳින්වේ.
(ලකුණු 2)

1. පරිසරයට හානි නොවීමට වග බලා ගැනීම. 2. ඇසුරුමට වැයවන පිරිවැය. 3. සාමාන්‍ය කොන්දේසි ඉටු වන බවට ඉංජිනේරුමය පරීක්ෂාව. 4. ඇසුරුමට යොදන අංග පිළිබඳව( දිග, පළල, හැඩය ආදී) (ලකුණු දෙකයි)

(iii) (අ) මිල - Price ස්ථානය - Place නිෂ්පාදිතය- product
ප්‍රවර්ධනය - Promotion (නම් කිරීමට ලකුණු දෙකයි)

(ආ) ව්‍යාපාරයකට උසස් ප්‍රතිඵල ලබා ගැනීමට නම් අලෙවිකරණයේ සියලුම සංරචක එකම අරමුණකින් යුතුව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවධාරණය කෙරෙයි. තරගකාරී ව්‍යාපාර පරිසරයට වඩා යෝග්‍ය වන්නේ සම්පූර්ණ ඒකාබද්ධ ප්‍රවේශයකි. (ලකුණු 1)

1. සම්බන්ධතා අලෙවිකරණය 2. සමෝධානික අලෙවිකරණය 3. අභ්‍යන්තර අලෙවිකරණය 4. කාර්යසාධන අලෙවිකරණය. (ලකුණු එකයි)

(iv) (අ) ව්‍යාපාරයකට අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ගවලින් සපයා ගැනීමේ හා එම අරමුදල් ඵලදායී ලෙස ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කරමින් අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීමේ සියළු කළමනාකරණ කටයුතු මූල්‍ය කළමනාකරණය ලෙස හඳින්වේ. (ලකුණු 2)

(ආ) අවශ්‍ය අරමුදල් පිළිබඳ සැලසුම් කිරීම, තම අවශ්‍යතා අනුව අරමුදල් සම්පාදනය කර ගැනීම සහ ඒවා සඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම මූල්‍ය කළමනාකරණය කාර්යය වේ. (ලකුණු 1)

හිමිකරුවන්ගේ ව්‍යාපාර හා සබැඳි (ධනය) අගය උපරිම කිරීමයි. (ලකුණු 1)

(v)(අ) 1. ලබා ගන්නා මූලාශ්‍රය අනුව - 1. අභ්‍යන්තර මාර්ග : නිදසුන් - රඳවා ගත් ලාභ, ක්ෂය වෙන්කිරීම.
2. බාහිර මාර්ග : නිදසුන් - බැංකු ණය, කල්බදු, කොටස් නිකුතුව.
2. සපයා ගන්නා ආකාරය අනුව -
1. ඍජු මාර්ග : නිදසුන් - රඳවාගත් ලාභ, ක්ෂය වෙන්කිරීම්.
2. වක්‍ර මාර්ග : නිදසුන් - කල්බදු, වාණිජපත්‍රිකා, බැංකු අයිරා. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයක් සතු අරමුදල් ව්‍යාපාරය තුළ හෝ පිටත වත්කම් වල හෝ යෙදවීම ආයෝජනය වන අතර, ඒ සඳහා ගන්නා තීරණ ආයෝජන තීරණ ලෙස හැඳින්වේ. (ලකුණු 2)

08. (i) (අ) වාසි - 1. පිරිවැය අඩුවීම, 2. ලබා ගැනීමේ පහසුව
සීමා - 1. විශාල අරමුදල් ප්‍රමාණයක් සපයා ගත නොහැකි වීම
2. කාරක ප්‍රාග්ධන ගැටලු මතුවීම. (සුදුසු වෙනත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න)

(ආ)කෙටිකාලීන මූල්‍ය බැඳීම් වලට මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කරන අනුපාත ද්‍රවශීලතා අනුපාත ලෙස හැඳින්වේ.

(ii)(අ) මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ, මූල්‍ය යටිතල පහසුකම්, මධ්‍යම බැංකුව.

(ආ) කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සම්බන්ධයෙන් මුදල් බේරුම්කරනු ලබන දිනයකි.

(iii) 1. ක්‍රමවත් හා සාධාරණ පිළිවෙලකට සුරැකුම්පත් නිකුත් කිරීම හා වෙළඳාම් කළ හැකි වෙළෙඳ පොළක් ඇති කිරීම හා පවත්වා ගෙන යාම.
2. ආයෝජකයන්ගේ අයිතීන් හා සම්බන්ධතා ආරක්ෂා කිරීම.
3. බලපත්‍රලත් කොටස් තැරැව්කරුවකු හෝ කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම් පිළිබඳ බැඳීම් ඇති කිරීමට අසමත් වීම හේතුවෙන් පැන නගින මූල්‍ය පාඩු වලින් ආරක්ෂා කිරීමට වන්දි අරමුදලක් ක්‍රියාත්මක කිරීම.
4. කොටස් වෙළඳපොළ විධිමත් කිරීම.

(iv) (අ) 1. සජීවී වීම. 2. ප්‍රතික්‍රියා දැක්විය හැකි බව. 3. අනිකුත් සම්පත් පාලනය කළ හැකි බව. 4. සංවිධානය විය හැකි බව. 5. පුහුණු කළ හැකි බව. 6. හැසිරීම විවිධ වීම. (කරුණු 4 ට ලකුණු 2)

(ආ) නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීම පිණිස ආයතනයේ වැඩ ඒකකයක් ලෙස කළ යුතු කාර්යයන් හා යුතුකම් වගකීම් සකස් කිරීම රැකියා නිර්මාණය වන අතර, රැකියාවක ලක්ෂණ හා අදාළ චර්යාවන් පිළිබඳවත්, එම රැකියාව සාර්ථක ලෙස ඉටු කිරීමට අවශ්‍ය සේවකයා සතු විය යුතු ගුණාංග, සුදුසුකම් පිළිබඳවත් කරනු ලබන ක්‍රමානුකූල විමර්ශනය රැකියා විශ්ලේෂණයයි.

(v) (අ) 1. සේවය සඳහා වූ ඉල්ලුම. 2. ආයතනයේ පරමාර්ථය. 3. නිෂ්පාදන ක්‍රමය. 4. සේවක විශ්‍රාම යාම 5. ඉල්ලා අස්වන සේවක ප්‍රමාණය. 6. උසස්වීම් ලබන සේවක සංඛ්‍යාව 7. අනාගත ව්‍යාපෘති 8. සේවය අවසන් කිරීම් (කරුණු 4කට ලකුණු 2)

(ආ) 1. සේවකයන් සමඟ සාකච්ඡා කිරීම. 2. සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීම.
3. සාමූහික ගිවිසුම් ඇතිකර ගැනීම. 4. බේරුම්කරුවෙකුට යොමු කිරීම
5. කම්කරු විනිශ්චය සභාවට යොමු කිරීම 6. කම්කරු දෙපාර්තමේන්තුව පැවරීම.
(කරුණු 4 ට ලකුණු දෙකයි)